# ඉතිහාසය

## 09 ශ්‍රේණිය

දෙවන පරිච්ඡේදය

# 02. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය

★ පෘතුගීසී හා ලන්දේසී යන බටහිර ජාතීන්ගෙන් පසු ඉංග්‍රීසිහු ලංකාවට පැමිණීම.

★ ඉංග්‍රීසීන්ගේ මව් රට බ්‍රිතාන්‍ය හෙවත් එංගලන්තයයි.

★ 1796 මුහුදුබඩ ප්‍රදේශ අල්ලාගත් ඉංග්‍රීසීන් 1815 මුළු රටම අල්ලාගෙන වසර 133 පාලනය කිරීම.

**<u>බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීමට බලපෑ හේතු</u>**

1. ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම
2. ත්‍රිකුණාමල වරායේ වැදගත්කම
3. වෙළෙඳ කටයුතුවල දී වැදගත් වීම

### 1. ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම

I ඉන්දියාවට ආසන්නයෙන් ලංකාව පිහිටා තිබීම.

I ඉන්දියාවේ නැගෙනහිර හා බටහිර වෙරළේ බලය ආරක්ෂා කරගැනීමේ දී වැදගත්වීම.

I පෙර අපර දෙදිග වෙළෙඳ මාර්ගවල මධ්‍යගතව ලංකාව පිහිටා තිබීම.

### 2. ත්‍රිකුණාමල වරායේ වැදගත්කම

I ස්වභාවික වරායක් වීම

I බෙංගාල බොක්කට හා අග්නිදිග ආසියාවට මුහුණලා පිහිටා තිබීම.

I බෙංගාල බොක්ක අවට ප්‍රංශයන් සමඟ ඇති වන යුද්ධවල දී ත්‍රිකුණාමල වරාය වැදගත්වීම.

### 3. වෙළෙඳ කටයුතුවල දී වැදගත් වීම

I කුරුඳු/ ගම්මිරිස් /කරාබුනැටි /එනසාල් වැනි කුළු බඩු ලබාගැනීමට හැකිවීම.

I ඇලි ඇතුන්/ඇත්දළ/මුතුමැණික් වැනි වෙළෙඳ ද්‍රව්‍ය මෙරට පැවතීම.

I බ්‍රිතාන්‍යයේ නිපදවන භාණ්ඩ විකුණාගැනීමට හැකි වෙළෙඳපලක් මෙරට පැවතීම.

## 1796 පෙර ඉංග්‍රීසීන් හා උඩරට රජවරු අතර පැවති දූත සබඳතා

| වර්ෂය | ඉංග්‍රීසි දූතයා | උඩරට රජු |
|---|---|---|
| 1762 | ජෝන් පයිබස් | කීර්ති ශ්‍රී රාජසිංහ රජු |
| 1782 | හියු බොයිඩ් | රාජාධිරාජසිංහ රජු |
| 1795 | රොබට් ඇන්ඩෲස් | රාජාධිරාජසිංහ රජු |

## පෙරදිග ඉන්දිය වෙළෙඳ සමාගම මෙරට මුහුදුබඩ ප්‍රදේශයේ බලය අල්ලා ගැනීම

I 1789 ප්‍රංශ විප්ලවයෙන් පසු ප්‍රංශ හමුදාව 1794 අසල්වැසි ඕලන්දය ආක්‍රමණය කළ අතර එහි පාලක පස්වන විලියම්(ස්ටැඩ්හෝල්ඩර්වරයා) එංගලන්තයට පලා යාම.

I ප්‍රංශ ජාතිකයින්ට විරුද්ධව ලන්දේසීන්ට ආධාර දීමට ඉංග්‍රීසින් ඉදිරිපත් වීම(ලංකාවේ ලන්දේසි ප්‍රදේශ ප්‍රංශයන් අතට පත්වීම වැළැක්වීම සඳහා ඉංග්‍රීසීන්ට භාරදිය යුතුය)

Iවිලියම් කුමරු කිව් මාලිගයේ සිට 1795 පෙබරවාරි 7 දා ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාරයාට කිව් ලිපිය එවීම.

I කිව් ලිපිය අනුව කටයුතු කිරීමට ෆන් එංගල් බෙක් ආණ්ඩුකාරයා අකමැති වීමI ඉංග්‍රීසීහු 1795 ත්‍රිකුණාමලයේ ෆෙඩ්රික් කොටුවට පහර දී අල්ලා ගත් අතර පසුව පෘතුගීසීන් යටතේ පැවති යාපනය, මන්නාරම හා කල්පිටිය ද 1796 පෙබරවාරි 16 දින කොළඹ ද අත්පත් කර ගත්හ.

## 1796 සිට 1815 දක්වා මුහුදුබඩ ප්‍රදේශ පාලනයේ වැදගත් අවස්ථා

1. පෙරදිග ඉන්දිය ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ පාලනය

2. ද්විත්ව පාලනය

3. කිරීටයේ පාලනය

1. පෙරදිග ඉන්දිය ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ පාලනය

★ 1796 සිට 1798 දක්වා වසර 2 මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම.

★ ලන්දේසීන් සතු බලකොටු අල්ලා ගැනීමට වියදම් වූ මුදල් පියවා ගැනීමට කටයුතු කිරීම.

★ ඒ අනුව නව බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

★ බදු එකතු කිරීම සඳහා මදුරාසි නිළධාරීන් හෙවත් අවුමිල්දාර්වරු පත් කිරීම.

## 1797 මුහුදුබඩ ප්‍රදේශයේ කැරැල්ල

I පොල්ගස් බද්ද/ලුණු බද්ද/මළු බද්ද වැනි බදු පැනවීම

I බදු එකතු කිරීම සඳහා අවුමිල්දාර් නම් නිළධාරීන් පත් කිරීම

I භාණ්ඩ වෙනුවට මුදලින් බදු අය කිරීම.

## ද මියුරන් කමිටුව

★ කැරැල්ල මර්දනය කළ ඉංග්‍රීසීන් ඒ පිළිබඳව සොයා බැලීමට කොමිසමක් පත් කිරීම එය ද මියුරන් කොමිසම ලෙස හැඳින්වේ.

2. ද්විත්ව පාලනය(17981802)

I ආර්ථික කටයුතු ඉංග්‍රීසි වෙළෙඳ සමාගම යටතේ ද දේශපාලන කටයුතු බ්‍රිතාන්‍ය මැදිහත් වීමෙන් ද පවත්වාගෙන යාම ද්විත්ව පාලනයයි.

● ද්විත්ව පාලනයේ බ්‍රිතාන්‍ය නියෝජිතයා වශයෙන් ෆෙඩ්රික් නෝර්ත් ලංකාවට පැමිණීම.

3. කිරීටයේ පාලනය

★ 1802 වෙළෙඳ සමාගම මුහුදුබඩ පාලනයෙන් ඉවත් කොට එම ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටය යටත් විජිතයක් බවට පත් කරගැනීම.

<u>ඉංග්‍රීසීන්ගේ උඩරට ආක්‍රමණ</u>

1. 1803 උඩරට ආක්‍රමණය

2. 1815 උඩරට ආක්‍රමණය

ඉංග්‍රීසීන් උඩරට රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු

1. රට මැද ස්වාධීන රාජ්‍යක් පැවතීම ඉංග්‍රීසීන්ට සෑම අතින්ම අවාසිවීම.

2.මුහුදුබඩ ඉංග්‍රීසි පාලනයට විරුද්ධව ඇති වන කැරැලිවල දී උඩරට රජු කැරැලිකරුවන් ආධාර කිරීම

3. මුහුදුබඩ ප්‍රදේශවල වැසියන් පවා උඩරට රජු තම රජු වශයෙන් පිළිගැනීම

4. කොළඹ හා ත්‍රිකුණාමලය අතර සබඳතා පැවැත්වීමේ දී උඩරට රාජධානිය බාධාවක් වීම

5. විශාල ආරක්ෂක වියදමක් දැරීමට සිදුවීම

| |
|---|
| 1798 රාජාධිරාජසිංහ රජුගේ මරණියෙන් පසු සිහසුනට උරුමකම් කියූ අගබිසවගේ සහෝදරයා වූ මිත්තුසාමි පන්නා දමා මහාධිකාරම් පිළිමතලව්වේගේ මෙහෙය වීමෙන් කන්නසාමි ශ්‍රී වික්‍රමරාජසිංහ නමින් 1798 උඩරට රජ කමට පත් කෙරිණි.මුත්තුසාමි ආරක්ෂාව පතා ඉංගීසීන් වෙතට පළා ගියේ ය. |

<u>1800 මැක්ඩෝවල්ගේ උඩරට දූත ගමන</u>

★ ඒ අනුව 1800 දී මැක්ඩෝවල්ගේ නායකත්වයෙන් දූත පිරිසක් උඩරටට යැවීමට ෆෙඩ්රික් නෝර්ත් කටයුතු යෙදී ය.

★ මැක්ඩෝවල් උඩරටට ගොස් රජු හා ප්‍රභූ පිරිස සමග සාකච්ඡා පැවැත්වූවත් එය සාර්ථක නොවිය.

1803 උඩරට ආක්‍රමණය

★ 1803 කොළඹ හා ත්‍රිකුණාමලයේ සිට හමුදා කණ්ඩායම් දෙකක් උඩරටට යැවීමට නෝර්ත් කටයුතු යෙදීය.

★ මැක්ඩෝවල්ගේ නායකත්වයෙන් ඉංග්‍රීසි හමුදාව මහනුවර නගරයට ඇතුළු වූහ.

★ ශ්‍රී වික්‍රමරාජසිංහ රජු හා නගර වැසියෝ ආරක්ෂක උපායක් වශයෙන් නගරය අතහැර ගොස් සංවිධානය වන්නට වූහ.

I ඉංග්‍රීසීන් මුත්තුසාමි කුමරා රජු හැටියට ප්‍රකාශයට පත් කරන ලදි.

★ වැසි සමය ආරම්භ වීමත් ඉංග්‍රීසි හමුදාව අතර ලෙඩ රෝග පැතිර යාමත් ,ආහාර හිඟ වීමත් වැනි හේතු නිසා ඉංග්‍රීසීන්ට තවදුරටත් එහි සිටීමට නොහැකි විය.

★ මින් ප්‍රයෝජන ගත් උඩරැටියන් එල්ල කළ ප්‍රහාර නිසා ඉංග්‍රීසි හමුදාවට මහත් පරාජයක් අත් විය.

I මුත්තුසාමි උඩරට රජුට බාරදීමට මේජර් ඩේවි ක්‍රියා කළ ද මුත්තුසාමි ඇතුළු ඉංග්‍රීසි හමුදාව උඩරැටියන් අතින් මිය ගිය බව සඳහන් වේ.

I ඉංග්‍රීසීන්ගේ ප්‍රථම උඩරට ආක්‍රමණය පරාජයවීම.

තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා

I 1805 ලංකාවට පැමිණි මොහු දෙවන ඉංග්‍රීසී ආණ්ඩුකාරවරයා ය.

I අනාගතයේ උඩරට ආක්‍රමණය කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම මොහුගේ වගකීම විය.

I ඒ සඳහා ජෝන් ඩොයිලි නම් උපායදූතයෙක් යොදා

ගැනීම. ජෝන් ඩොයිලි

I 1774 එංගලන්තයේ උපත ලැබීම.

I සිවිල් සේවකයෙකු ලෙස ලංකාවට පැමිණීම.

I සිංහල භාෂාව/සිංහල සිරිත්විරිත් පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම.

I පිළිමතලව්වේ/මීගස්තැන්න/ඇහැලේපොල හා මොල්ලිගොඩ වැනි රදළයන් සමඟ සබඳතා පැවත්වීම.

★ වෙනත් කිසිදු යුරෝපා ජාතයකට සොයා ගත නොහැකි රහස් රැසක් ඩොයිලි මගින් ඉංග්‍රීසීන් දැන ගැනීම.

<u>උඩරට රාජධානියේ අභ්‍යන්තර බල අරගලය</u>

1. රජු හා රදළ ප්‍රධානීන් අතර ඇති වූ අරගලය

2. රජු හා භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ බල අරගලය

3. රදළ ප්‍රධානීන් අතර ඇති වූ බල අරගලය

4. රජු හා සාමාන්‍ය ජනතාව අතර ඇති වූ අරගලය

1. රජු හා රදළ ප්‍රධානීන් අතර ඇති වූ අරගලය

I සිංහල රදළයන්ගේ බලතල තම ඥාතී රදළයන්ට ලබා දීම.

I පිළිමතලව්වේ ඇතුළු කිහිප දෙනෙකු මරා දැමීම

I රදළයන් අතර අර්බුද ඇති වන ආකාරයේ තනතුරු ප්‍රදානය සිදු කිරීම

උදා: පිළිමතලව්වගෙන් හිස් වූ පළමු අධිකාරම් ධූරයට ඇහැලේපොල පත් කොට පරම හතුරා වූ මොල්ලිගොඩ දෙවන අධිකාරම් ලෙස පත් කිරීම.

2. රජු හා භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ බල අරගලය

I පරණාතල කුඩා හිමියන් ඇතුළු භික්ෂු ඝාතන කිහිපයක් සිදු කිරීම.

I දළදා මාළිගාව සතු ඉඩම් කිහිපයක් රාජසන්තක කිරීම

I දළද ා මාළිගාවේ නවීකරණ කටයුතු සඳහා භික්ෂූන් වහන්සේලාගෙන් උපදෙස් ලබා නොගැනීම.

1815 උඩරට ආක්‍රමණය

I 1815 වන විට පැවති තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා උඩරට ආක්‍රමණය කිරීම

I ජෝන් ඩොයිලිගේ බුද්ධි තොරතුරු මත හා ඇහැලේපොලගේ උපදෙස් මත ඉංග්‍රීසී හමුදාව උඩරටට ඇතුල් වූහ.

I කොළඹ/ගාල්ල/මීගමුව/ත්‍රිකුණාමලය හා මඩකලපුව යන ප්‍රදේශවලින් සේනාංක 08ක් මහනුවර ඇතුල්විය.

I පෙර මෙන් ජනතාවගේ ආරක්ෂාව නොලැබුණු රජු මැදමහනුවරට ගොස් සැඟවුණු අතර උඩරැටියන් රජු අල්ලා ඉංග්‍රීසීන්ට භාර දුන්නේය.

I 1816 ඉන්දියාවේ වෙල්ලෝරයට පිටුවහල් කළ බව සඳහන් වේ.

## 1815 උඩරට ගිවිසුම

I 1815 මාර්තු 2 දින මහනුවර මඟුල්මඩුවේ දී ගිවිසුම අත්සන් කිරීම.

★ ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉංග්‍රීසී කොඩිය එසවීමට ක්‍රියා කිරීම නිසා එයට විරුද්ධ වූ වාරියපොල ශ්‍රී සුමංගල හිමි ඉංග්‍රීසී කොඩිය බිම දමා සිංහල කොඩිය එස වූ බව සඳහන් වේ.

I එංගලන්තයේ 111 වන ජෝර්ජ් වෙනුවෙන් රොබට් බ්‍රවුන්රිග් ද උඩරැටියන් වෙන්වෙන් රදළ ප්‍රධානින් කිහිප දෙනෙක් ගිවිසුමට අත්සන් කොට ඇත.

I වගන්ති 12 කින් ගිවිසුම සමන්විත වේ.

ගිවිසුමේ වගන්ති

★ 2 වගන්තිය ශ්‍රී වික්‍රමරාජසිංහ රජු සිහසුනෙන් නෙරපන ලද බව ද ඔහුගේ ඥාතීන්ට උඩරට සිහසුනට ඇති අයිතිය අහිමිවන බව

★ 4 වගන්තිය උඩරට මොහොට්ටාල/කෝරාල ඇතුළු රදළයන්ගේ බලතල තනතුරු අයිතිවාසිකම් ආරක්ෂා කරන බව

★ 5 වගන්තිය බුදු දහම හා දේව ආගම ආරක්ෂා කරන බව

## 1818 නිදහස් සටන

★ සටනට බල පෑ හේතු

1. රජෙකු නොමැති වීම නිසා ජනතාව තුළ ඇති වූ කලකිරීම.

2. බුදු දහම නොසලකා හැරීම.

3. රදළයිනගේ බලතල හා වරප්‍රසාද අහිමිවීම

I ආසන්නම හේතුව වෙල්ලස්සේ මඩිගේ මුහම්දිරම් වශයෙන් හජ්ජි මරික්කාර් නැමති මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීම.

සටනේ ආරම්භය හා ව්‍යාප්තිය

I උඩරට රජු හැටියට පෙනී සිටි දොරේසාමි නැමැත්තෙක් වෙල්ලස්ස ප්‍රදේශයෙන් මතු වීම.

I දොරේසාමි අත්අඩංගුවට ගැනීමට ඌව ඒජන්තවරයා හජ්ජි මරික්කාර් වෙල්ලස්සට යැවීම.

I සටන්කාමීන් අතින් හජ්ජිමරික්කාර් මිය යාම.

I පසුව දොරේසාමි අල්ලා ගැනීමට බදුල්ලේ උපඒජන්ත වූ විල්සන් හා ලෙප්ටිනන්ට් නිව්මන් වෙල්ලස්සට යාම.

I සටන්කරුවන් අතින් ඔහු ද මිය යාම

I ඉංග්‍රීසීන් දැඩිව සටන මර්දනය කිරීමට තිරණය කිරීම

I සටන මර්දනය කිරීමට ඌව දිසාව භාරව සිටි මොනරවිල කැප්පෙටිපොළ යවූ අතර ඔහු ද සටන් කරුවන්ට එක් වූ බව සඳහන් වේ.

සටන ව්‍යාප්ත වූ ප්‍රදේශ

I වෙල්ලස්ස /දුම්බර /හේවාහැට/හාරිස්පත්තුව/මාතලේ /නුවර කලාවිය/හත්කෝරළය හා සබරගමු ප්‍රදේශ

සටනේ නායකයන්

1. කැප්පෙටිපොළ නිළමේ
2. මඩුගල්ලේ දිසාව
3. කිවුලෙගෙදර මොහොට්ටාල
4. පිළිමතලව්වේ දෙවන අධිකාරම්
5. බූටෑවේ රටේ රාල

★ සටන අසාර්ථක වීම

I සටන මර්දනය කිරීම සඳහා ඉංග්‍රීසීන් මාර්ෂල් ලෝ හෙවත් යුධ නීතිය පනවා බිම් පාළු ප්‍රතිපත්තිය අනුගමන කිරීම.

● මේ අනුව සාමාන්‍ය ජනතාවගේ ගේ දොර වගාව අහාර ඇතුළු දේපළ ගිනි තබා විනාශ කොට සටන අඩපණ කිරීම.

සටන අසාර්ථක වීමට හේතු

1. සටන මනාව සංවිධානය නොවීම
2. ඉංග්‍රීසීන්ගේ දැඩි මර්දනකාරී ප්‍රතිපත්තිය
3. සටනේ නායකයින් අතර පෞද්ගලික එදිරිවාදිකම් පැවතීම
4. ඉංග්‍රීසීන්ගේ නවීන අවිආයුධවලට සිංහලයන් මුහුණදීමට නොහැකවීම
5. රාජ්‍ය උරුමය කියා සටනට නායකත්වය දුන් දොරේසාමි ව්‍යාජ පුද්ගලයෙක් බව හෙළිවීම
6. දළදා වහන්සේ ඉංග්‍රීසීන් සතුවීම

සටනේ ප්‍රතිඵල

1. කැපපෙටිපොළ මඩුගල්ලේ වැනි නායකයින් හිස ගසා මරාදැමීම
2. ඇහැළේපොල ඇතුළු කිහිප දෙනෙක් මුරුසි දිවයිනට පිටුවහල් කිරීම
3. 1818 උඩරට ප්‍රකාශය මගින් බ්‍රිතාන්‍ය බලය තහවුරු කර ගැනීම
4. රදළයන්ගේ බලතල වරප්‍රසාද අහෝසි කිරීම

## 1848 දෙවන නිදහස් සටන

1. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ

2. ටොරින්ටන් සාමිවරයාගේ නව බදු ප්‍රතිපත්තිය

I කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් වතු වගාව සඳහා ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කිරීම

I 1840 මුඩු බිම් පනත මගින් වගා නොකළ නීත්‍යනුකූල අයිතිය තහවුරු කළ නොහැකි ඉඩම් රජයට පවරා ගැනීම නිසා ජනතාවට ඉඩම් අහිමිවීම.

I වතු වගාව කෙරෙහි රජය දැඩි අවධානයක් යොමු කළ අතර දේශීය කෘෂිකර්මාන්තය නොසළකා හැරීම

I බුදු දහම නොසලකා හැරීම

I රට පුරා සුරාව ව්‍යාප්තවීම හා සමාජය පිරිහිම

2. ටොරින්ටන් සාමිවරයාගේ නව බදු ප්‍රතිපත්තිය

I මුද්දර බද්ද/බලු බද්ද/ඔරුපාරු බද්ද/තුවක්කු බද්ද/කරත්ත බද්ද/ඇඟ බද්ද/වෙළෙඳ සැල් බද්ද සටන ආරම්භවීම

I ඇඟ බද්ද/බලු බද්ද හා තුවක්කු බද්දට එරෙහිව ජනතාව තුළින් දැඩි විරෝධයක් මතු විය.

Iබදු විරෝධතාකරුවන් 1848 ජූලි මස දුම්බර රටේ මහතා වූ මඩුගල්ලේගේ ප්‍රධානත්වයෙන් මහනුවර ඒජන්තවරයා හමු වීමට යාම.

I විරෝධීන් විසුරුවා හැරීමට පැමිණි පොලිස් නිලධාරී ලොකු බණ්ඩා දුනුවිල මහතාට අසු පිටින් වැටෙන තුරු පහරදුන් බව සඳහන් වේ.

★ සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ මාතලේ ප්‍රදේශයයි.

★ මාතලේ/කුරුණෑගල/නුවරකලාවිය/තමන්කඩුව/හාරිස්පත්තුව/ගාල්ල/මහනුවර/දඹුල්ල යන ප්‍රදේශවල සටන ව්‍යාප්තවීම

1848 සටනේ නායකයින්

කඩහපොල හිමි /ගොංගාලේගොඩ බණ්ඩා(පැලියගොඩ ඩේවිඩ්)/පුරන් අප්පු/ඩිංගිරාල

★ 1848 ජූලි මාසයේ දී ගොංගාලේගොඩ බණ්ඩා ශ්‍රී වික්‍රම සර්වසිද්ධි නමින් දඹුල්ලේ දී ඔටුනු පැළඳි බව සඳහන් වේ.

සටන අසාර්ථක වීම

★ උඩරට ප්‍රදේශ කිහිපයක පමණ සටන ව්‍යාප්තවීම

★ ඉංග්‍රීසීන් සිය හමුදාව මෙහෙයවා සටන ව්‍යාප්තවීම වැලැක්වීම.

★ ආණ්ඩුකාර ටොරින්ටන් මාර්ෂල් ලෝ හෙවත් යුධ නීතිය පැනවීම

★ කඩහපොල හිමි/වීර පුරන් අප්පු සහ ඩිංගිරාල වැනි නායකයින් යුධ අධිකරණයෙන් වැරදිකරුවන් කොට වෙඩි තබා මරා දැමීම

සටනේ ප්‍රතිඵල

1. සටනට හේතු සොයා බැලීමට බේලි මහතාගේ මූලිකත්වයෙන් කමිටුව පත් කිරීම

2. ටොරින්ටන් ආණ්ඩුකාර හා යටත් විජිත ලේකම් එමර්සන් ටෙනන්ට් නැවත එංගලන්තයට කැඳවීම
3. වෙළෙඳ සැල් බද්ද සහ බලු බද්ද අවලංගු කොට මුද්දර හා ඇඟ බද්ද සංශෝධනය කිරීම
4. කෘෂිකර්මාන්ත හා වාරිමාර්ග කටයුතු දියුණු කිරීමට පියවර ගැනීම
5. දළදා වහන්සේගේ භාරකාරත්වය නැවත වතාවක් බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතට ගැනීම